***ඒකාබද්ධ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයක් මගින් ශ්‍රී ලංකාව තුළ කඩිනමින් ආහාර සුරක්ෂිතභාවයක් ඇතිකරලීම සඳහා ක්‍රියාත්මක කරන "සාර ශ්‍රී ලංකා - ආහාර සුරක්ෂිතතා වැඩසටහන"***

| මාතෘකාව | ***සාර ශ්‍රී ලංකා - ආහාර සුරක්ෂිතතා වැඩසටහන*** |
|---|---|
| පසුබිම | ශ්‍රී ලංකාව, ඉතිහාසය තුල ඉතා බැරෑරුම් අවස්ථාවකට මුහුණ දෙමින් සිටී. ලෝකයේ ඕනෑම රටක සමාජ, දේශපාලන හා ආර්ථික ස්ථායීතාවය සඳහා සාර්ව ආර්ථික ස්ථායීතාවය බලපාන අතර, එහි එක් වැදගත් අංගයක් වන්නේ විනිමය අනුපාත ස්ථායීතාවයයි. අස්ථාවර විනිමය අනුපාතයකට බලපාන විදේශ විනිමය සංචිත හිඟය හේතුවෙන් ආහාර හා ඖෂධ සපයා ගැනීමට මෙන්ම බලශක්ති ප්‍රභවයන් සම්පාදනය කරගැනීමද අර්බුදයක් බවට පත්ව තිබේ.<br>ආහාර හා පාන වර්ග ආනයනය සඳහා 2020 වර්ෂයේ දී වියදම් වූ මුදල ඇමරිකන් ඩොලර් මිලියන 1554.4 සිට 2021 වර්ෂය වනවිට ඇ ඩො මි 1,666.5 දක්වා වැඩිවිය. මෙම වියදම 2020 දී මුළු ආනයන වියදමෙන් 9.7% ක් වූ අතර 2021 දී එය මුළු ආනයන වියදමෙන් 8.1% කි.<br>අන්තර් භාණ්ඩ වශයෙන් ආනයනය කරනු ලබන තිරිඟු හා ඉරිඟු මීට ඇතුළත් නොවන අතර, එම භාණ්ඩ සඳහා වන ආනයන වියදම් 2020 දී හා 2021 දී පිළිවෙළින් ඇමරිකන් ඩොලර් මිලියන 384.4 ක් හා 418.3 ක් විය. එය මුළු ආනයන වියදමෙන් 2.4% ක් හා 2.0% කි. ඒ අනුව ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා වර්ෂයකට ආසන්න වශයෙන් ඩොලර් මිලියන 2000.0 ක් පමණ වියදම් වේ. මේ වනවිට මෙරට සතු විනිමය සංචිතය ඇ ඩොලර් මිලියන 50.0 ත් වඩා අඩු බව පාර්ලිමේන්තුව හමු වේ ප්‍රකාශ විය ( 2022 මැයි 05) . එමෙන්ම මහ බැංකු වාර්තා පෙන්වා දෙන පරිදි සතියක ආනයන වියදම සඳහාවත් මෙම සංචිතය ප්‍රමාණවත් නොවේ ( 2022 මැයි 11 පුවත්පත් සාකච්ඡාව).<br>එමෙන්ම 2021/22 මහ කන්නයේ වී අස්වනු ප්‍රමාණය සාමාන්‍ය ප්‍රමාණයෙන් 50% ටත් වඩා අඩු වූ බව මේ වනවිට ත් අනාවරණය වී ඇති අතර, 2022 යල කන්නයේදී දේශීය වශයෙන් නිෂ්පාදිත පොහොර ලබාදීමද ප්‍රමාදවීම හේතුවෙන් බරපතල ආකාරයේ අස්වනු අඩු වීමක් අපේක්ෂා කෙරේ.<br>තවද, ඉන්ධන හිඟය හේතු කොටගෙන සහල්, එළවළු හා පළතුරු ප්‍රවාහනයට බාධා ඇතිවීමෙන් රට තුළ නිෂ්පාදනය වන ආහාර බෙදාහැරීමේ යාන්ත්‍රණය ද අඩපණ වී ඇත. ඉන්ධන ආනයනය සඳහා 2020 හා 2021 වර්ෂවල දී දරණ ලද වියදම පිළිවෙළින් ඇමරිකන් ඩොලර් මිලියන 2,542.6 ක් සහ 3,742.9 වී ඇත. 2022 වසර සඳහා ඉන්ධන ආනයනයට අවශ්‍යවන සම්පූර්ණ මුදල් ප්‍රමාණය පෙර වර්ෂ වලටත් වඩා වැඩි වනු ඇත. එම මුදල විදේශ ණය මගින් හෝ සපයාගත නොහැකි මට්ටමකට රට පත්ව ඇති බැවින් සැපයුම් දාම ද බිඳවැටීමකට ලක්වී ඇත.<br>සත්ත්ව නිෂ්පාදන හා පශු සම්පත් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මහජනතාවට ලාභදායීම සත්ත්ව ප්‍රෝටීන සපයන ප්‍රභවයක් වන කුකුළු පාලන කර්මාන්තය ද බරපතළ අවදානමකට මුහුණ දී ඇත. සත්ත්ව ආහාර ආනයනය අඩාලවීම, බඩ ඉරිඟු ආනයනය හා දේශීය බඩ ඉරිඟු නිෂ්පාදනය පහළ වැටීම හේතුකොට ගෙන බිත්තර සඳහා සතුන් ඇතිකිරීම සීමා වී ඇත.එනිසාවෙන් කුකුල් පාලන කර්මාන්තකරුවන් එම කර්මාන්තයෙන් සීඝ්‍රයෙන් ඉවත්වෙමින් සිටී. තවද, බඩ ඉරිඟු සපයාගැනීමේ අපහසුව හේතු කොටගෙන ත්‍රිපෝෂ නිෂ්පාදනය ද මේ වනවිටත් සීමා වී තිබේ. ධීවර |

| | |
|---|---|
| | කර්මාන්තය ද ඉන්ධන සපයාගැනීමේ ගැටළු හේතුවෙන් අඩාලවෙමින් පවතී. මෙම සියළු තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාලීමේ හැකියාව බරපතළ ලෙස අවධානමකට ලක්ව ඇති අතර ගර්භනී මව්වරුන් හා කිරිදෙන මව්වරුන් අතර රක්තහීනතාවය හා ළදරුවන්ගේ මන්දපෝෂණය ද ඉහළ යාමේ අවධානමකට ලක් වීමට බොහෝ සෙයින් ඉඩ ඇත. එබැවින්, මෙම වැඩසටහන මගින් ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාලී ම පිලිබඳව ද අවධානය යොමු කෙරේ.<br>ජනතාවගේ මිළදී ගැනීමේ හැකියාව අවම මට්ටමකට පත්වීම හා වෙළඳපොළ භාණ්ඩ හිගය හේතුවෙන් පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා ගැනීම අභියෝගයක් වෙමින් පවතී.<br>මෙවැනි තත්ත්වයක් ඇතිවීම වළක්වාලීමට ගතයුතු සාධනීය පියවරක් ලෙස "සාර ශ්‍රී ලංකා" ආහාර සුරක්ෂිතතා වැඩසටහන යෝජනා කෙරේ. |
| **යෝජිත ව්‍යාපෘතියේ පරමාර්ථය හා අරමුණු** | **පරමාර්ථය**<br>ආහාර සුරක්ෂිතතාවය වර්ධනය<br>**අරමුණු**<br>1. රට තුළ ඇතිවිය හැකි ආහාර හිඟය පිටුදැකීම<br>2. විදේශ විනිමය සංචිතය මත ඇතිවන පීඩනය අවම කිරීමට දායකවීම.<br>3. සුළු, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හා ව්‍යවසායයන් ප්‍රවර්ධනය. |
| **මෙම ක්‍රියාවලිය තුලින් ජනතාවට ලබාගත හැකි වාසි හා ප්‍රයෝජන** | • ආහාර හිඟයක් ඇතිවීම වළක්වාලීම<br>• පහසුවෙන් හා අඩු වියදමකින් ආහාර ද්‍රව්‍ය ලබාගැනීමට පහසුකම් ඇති කිරීම<br>• පෝෂණ ඌනතා මග හැරීම |
| **මෙම ක්‍රියාවලිය සඳහා සම්බන්ධ විය යුතු හා ක්‍රියාත්මක විය යුතු ආයතන** | • කෘෂිකර්ම රේඛීය හා පළාත් අමාත්‍යාංශ ( කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු හා අනෙකුත් අදාළ සියළුම ව්‍යයවස්ථාපිත ආයතන)<br>• වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා ඒ යටතේ අදාල ආයතන<br>• අධ්‍යාපන රේඛීය හා පළාත් අමාත්‍යාංශ (පාසල් හා උසස් අධ්‍යාපන ආයතන, විද්‍යා පීඨ ,රජයේ විශ්ව විද්‍යාල වල කෘෂි පීඨ,තෘතීය අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන, පිරිවෙන් ඒකකය )<br>• රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල)<br>• ආරක්ෂක අමාත්‍යාංශය ( ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂණ දෙපාර්තමේන්තුව )<br>• සෞඛ්‍ය රේඛීය හා පළාත් අමාත්‍යාංශ (සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ආයුර්වේද දෙපාර්තමේන්තුව)<br>• වාරිමාර්ග රේඛීය හා පළාත් අමාත්‍යාංශ ( වාරිමාර්ග දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය)<br>• පරිසර අමාත්‍යාංශය<br>• ඉඩම් අමාත්‍යාංශය (ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, හා යටතේ ඇති ආයතන)<br>• වෙළඳ අමාත්‍යාංශය ( සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, පලාත් සමූපකාර |

<table>
<tr>
<td></td>
<td>
සංවර්ධන දෙපාර්තමේන්තු)
<ul>
<li>ජනමාධ්‍ය අමාත්‍යාංශය (රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව)</li>
<li>පොලිස් දෙපාර්තමේන්තුව ( ප්‍රජා පොලිස් ඒකකය )</li>
<li>ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය (ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය)</li>
<li>සමෘද්ධි දෙපාර්තමේන්තුව</li>
<li>බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව</li>
<li>මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව</li>
<li>අපනයන සංවර්ධන මණ්ඩලය</li>
<li>කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය</li>
<li>ජාතික යොවුන් සේනාංකය</li>
<li>ජාතික තරුණ සේවා සභාව</li>
<li>කෘෂිකර්ම හා ආහාර ක්ෂේත්‍රයට අදළ සියලු සංගම් (කෘෂි විද්‍යාර්ථයින්ගේ සංගමය, පෝෂණවේදීන්ගේ සංගමය ඇතුළු එවැනි අදාල සංගම්</li>
<li>අදාල අමාත්‍යාංශවල වෘත්තීය සංගම්</li>
<li>ජනමාධ්‍ය ආයතන</li>
<li>ප්‍රජා මූල/මූලික සංවිධාන</li>
<li>සණස, සර්වෝදය වැනි රාජ්‍ය නොවන ආයතන, සිවිල් සංවිධාන හා විශේෂඥතාවයෙන් යුතු සම්පත් පුද්ගලයින්</li>
<li>ග්‍රාම නිලධාරීන් ඇතුළු ග්‍රාමීය මට්ටමේ සියළු කේෂත්‍ර නිලධාරීන්</li>
<li>වෙනත් අදාළ ආයතන හා පුද්ගලයින්</li>
</ul>
</td>
</tr>
<tr>
<td>දේශීය නිෂ්පාදනය හා ආනයනය පිළිබඳව පවත්නා තත්වය.</td>
<td>
2021 යල ,මහ කන්න දෙකෙහිම සහල් මෙ.ටො. මිලියන 3.3 ක් නිෂ්පාදනය වුව ද, එම වර්ෂයේ සහල් ආනයනය ද මෙ.ටො. 147,091 ක් විය. ( දේශීය සහල් නිෂ්පාදනය මාස 17 ට ප්‍රමාණවත් වුව ද, සම්පූර්ණ නිෂ්පාදනය වෙළඳපොල වෙත නොසැපයේ.) මෙම ආනයන මට්ටම සිදුව ඇත්තේ 2020 වර්ෂයේ වාර්ෂික සහල් ආනයනය මෙ.ටො. 15,770 ක් වූ පසුබිමකය. 2021 වර්ෂයේ ආනයන ප්‍රමාණයෙන් මෙ.ටො. 134,716 ක්ම ආනයනය කොට ඇත්තේ 2021 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස දෙක තුළදීය. ( ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව - 2021) 2022 වර්ෂයේ දී සහල් ආනයන අවශ්‍යතාව මීට වඩා වැඩිවිය හැකි වුව ද, විනිමය හිඟය හේතු කොටගෙන එය දුෂ්කර කාර්යයක් වනු ඇත. ඒ අනුව, 2022 වර්ෂයේ දී සහල් හිඟයක් වෙළඳපොල තුළ මතුවනු ඇත.<br>
දේශීය සහල් නිෂ්පාදනය අඩුවීමත් සමඟ ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රධාන ආහාරය සපයාගැනීම පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් ඇතිවීම අනිවාර්යයෙන්ම අපේක්ෂා කළහැකි තත්ත්වයකි.<br>
මේ අතර අනෙකුත් ආනයනික ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් ද දක්නට ලැබෙන්නේ සාධනීය තත්ත්වයක් නොවේ.<br>
දේශීය පරිභෝජනය සඳහා මෙ.ටො. 2000 ක් පමණ වන තිරිඟු පිටි, මෙ.ටො.175 ක් වන පරිප්පු වැනි ආහාර ද්‍රව්‍ය මුළුමනින්ම ආනයනය කරනු ලබන අතර, එම ආහාර ද්‍රව්‍ය ආනයනය ඉදිරියේ දී අත්හිටුවීමට, සීමාකිරීමට හෝ මිල ඉහළයාමකට ලක්වනු ඇත.<br><br>
2019 වසරේදී , ප්‍රධාන ආනයන වර්ග 10 හා ආනයන ප්‍රමාණයන් පහත දැක්වේ.
</td>
</tr>
</table>

*වාර්ෂික ආහාර පරිභෝජනය හා ආනයනය පිළිබඳ තොරතුරු 2019*

| | ආහාර වර්ගය | සම්පූර්ණ පරිභෝජනය (මෙ ටො) | ඒක පුද්ගල පරිභෝජනය ( කි ග්‍රෑ) | වාර්ෂික ආනයනය (මෙ ටො) |
|---|---|---|---|---|
| 1 | සහල් | 2,332,921.00 | 107.00 | - |
| 2 | ලොකු ළූණු | 263,344.82 | 12.08 | 239,969.82 |
| 3 | වියලි මිරිස් | 52,558.76 | 2.41 | - |
| 4 | සුදු ළූණු | 31,766.58 | 1.46 | - |
| 5 | පරිප්පු (මයිසූර්) | 175,292.45 | 8.04 | - |
| 6 | අල | 243,705.55 | 11.18 | 142,063.55 |
| 7 | මුං ඇට | 20,615.77 | 0.95 | 13,260.77 |
| 8 | කව්පි | 16,581.61 | 0.76 | 8,514.61 |
| 9 | තිරිඟු | 1,959,085.56 | 89.85 | - |
| 10 | සීනි | 479,365.55 | 21.99 | - |

මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, හෙක්ටර්කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනය

**සළකා බැලිය යුතු වෙනත් ආනයන ( 2020 මාර්තු සිට 2021 මාර්තු දක්වා)**

(ඇමරිකන් ඩොලර් මිලියන)

| අයිතමය | 2019 වර්ෂය | 2020 වර්ෂය |
|---|---|---|
| සහල් | 12.8 | 10.5 |
| කිරි නිෂ්පාදන | 311.9 | 333.8 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදන | 552.6 | 595.5 |
| පොහොර | 221.4 | 258.9 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 2489.7 | 2176.1 |

*මූලාශ්‍රය: මෑත කාලීන ආර්ථික ප්‍රවනතා - ශ්‍රී ලංකා මහ බැංකුව 2021*

ඒ අනුව ආනයන සීමා කිරීමට සිදුවුවහොත් රට තුළ සහල්, පිටි, ලූණු, පරිප්පු හා ධාන්‍ය වැනි ආහාර ද්‍රව්‍ය පිළිබඳ දැඩි හිඟයක් ඇතිවනු ඇත. මෙම තත්ත්වය දේශීය විකල්ප ආහාර නිෂ්පාදන මිල ඉහළ යාමට හා වෙළඳපොල තුළ නොසන්සුන්තාවයක් ඇතිකිරීමට ද හේතු වනු ඇත. මීට අමතරව රට තුළ ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමේ ගැටළු ද

| | |
|---|---|
| | මතුවිය හැක.<br>ඒ අනුව වී වගාවට අමතරව අර්තාපල් ඇතුළු අල භෝග, එළවළු වර්ග, ධාන්‍ය වර්ග, මාශ භෝග, තෙල් භෝග (රටකජු, තල වැනි) , පළතුරු සහ කුළුබඩු භෝග ආදියේ මිල ඉහළ යනු ඇත.<br>මෙම ආහාර ද්‍රව්‍ය වෙළඳපොල තුළ බහුල කිරීම ඒ අනුව ඉතා වැදගත් වේ. |
| ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල | 1. ඒකාබද්ධ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයක් හඳුන්වා දීම<br>2. ජාතික/පළාත් /දිස්ත්‍රික් / ප්‍රාදේශිය /ග්‍රාමීය ආහාර සුරක්ෂිතතා කමිටු ඇති කිරීම<br>3. ආහාර පරිභෝජන රටාවේ වෙනසක් ඇති කරමින් කුටුම්භය තුළ සකසුරුවම් බව ඇතිවීම<br>4. දරිද්‍රතාවයේ පහළම මට්ටමේ සිටින පවුල් ඒකක සඳහා ප්‍රමාණවත් පරිදි අවශ්‍ය වන ආහාර ප්‍රමාණයක් ලබා දීම<br>5. මේ දක්වා රටතුළ ක්‍රියාත්මක ගෙවතු වගා සංකල්පයට තිරසර බවක් ඇතිවීම<br>6. සහල් නිෂ්පාදනය ප්‍රශස්ත මට්ටමට ලගාවීම<br>7. අතිරික්ත ආහාර ද්‍රව්‍ය අනාගත භාවිතය සඳහා සංරක්ෂණය කිරීම<br>8. ග්‍රාමීය මට්ටමේ නව ව්‍යාපාරික අවස්ථා බිහිවීම<br>9. ආහාර ද්‍රව්‍ය ආනයනය මගින් විනිමය සංචිතය මත ඇතිකරන පීඩනය අඩුවීම<br>10. විනිමය සංචිතය ගොඩනැගීමට දායකවීම |
| **ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීම සඳහා යෝජිත ක්‍රියාකාරකම්** | 1. මෙම ක්‍රියාවලිය සඳහා සම්බන්ධ විය යුතු හා ක්‍රියාත්මක විය යුතු සියළුම ආයතන සහ පුද්ගලයින් හඳුනාගෙන වැඩසටහන හඳුන්වා දීම<br>2. ඒකාබද්ධ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයක් හඳුන්වා දීම තුළින් ජාතික/පළාත් /දිස්ත්‍රික් / ප්‍රාදේශිය /ග්‍රාමීය ආහාර සුරක්ෂිතතා කමිටු ඇති කිරීම ආරම්භ කිරීම සඳහා සියලු පාර්ශව කරුවන් සම්බන්ධීකරණය කිරීම<br>3. එක් එක් ආයතන හා පුද්ගලයින් විසින් ඉටුකිරීමට එකග වන කාර්යයන් හඳුනාගෙන ඉදිරිපත් කිරීම<br>4. එක් එක් ආයතන වෙතින් අපේක්ෂිත ඉලක්ක ළගා කරගැනීම පිළිබඳව තහවුරුවක් ලබා ගැනීම<br>5. පළාත් ප්‍රධාන ලේකම්වරු / අදාල අමාත්‍යාංශ ලේකම්වරු / දෙපාර්තමේන්තු ප්‍රධානීන් / රාජ්‍ය නොවන සංවිධාන / ප්‍රජා සංවිධාන /සම්පත් පුද්ගලයින් ඇතුළු සියළුම පාර්ශව වෙත යෝජිත වැඩසටහන පිළිබඳ තොරතුරු පත්‍රිකාව යොමු කිරීම<br>6. "සාර ශ්‍රී ලංකා - ආහාර සුරක්ෂිතතා වැඩසටහන" මැයි මස 23 සිට 31 දක්වා ප්‍රකාශයට පත්කර ක්‍රියාත්මක කරවීම.<br>7. මෙම වැඩසටහනින් අපේ ක්ෂිත අරමුණු ළගා කර ගැනීම සඳහා අදාළ සියළු පාර්ශවයන් නියෝජනය වන ජාතික කමිටුවක් පිහිටුවා සමස්ථ වැඩසටහන සැළසුම් කිරීම, ක්‍රියාත්මක කරවීම, මෙහෙයවීම හා පසුවිපරම<br>8. ග්‍රාමීය / ප්‍රාදේශීය / දිස්ත්‍රික් /පළාත් මට්ටමින් විසදාගත නොහැකි ගැටළු විසදීම වෙනුවෙන් ජාතික කමිටුව මැදිහත් වීම<br>9. බලශක්තිය සපයා දීම, අපනයන ක්‍රියාවලීන් පහසු කිරීම, අත්‍යවශ්‍ය යෙදවුම් ආනයනය, නව තාක්ෂණික ක්‍රමවේද දිවයිනටම හඳුන්වා දීම, දත්ත හා තොරතුරු හුවමාරුව වැනි අවස්ථාවන්හිදී ජාතික කමිටුව සෘජුවම මැදිහත් වීම<br>10. ආකල්පමය සංවර්ධනයක් සඳහා ජනමාධ්‍ය /සමාජ මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීමේ මෙහෙයුම් කටයුතු සිදුකිරීම.<br>11. පවතින ප්‍රතිපත්ති / නීති සංශෝධනය කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා මැදිහත් වීම<br>12. මෙහිදී ක්‍රියාත්මක වන ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශය අඛණ්ඩව විධිමත්ව |

| | |
|---|---|
| | ක්‍රියාත්මක කිරීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යෝජනාවක් ඉදිරිපත් කිරීම |
| **ව්‍යාපෘතියේ මෙහෙයවීම** | ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය හා මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව එක්ව මෙම වැඩසටහන සම්බන්ධීකරණය සිදු කරන අතර විධිමත් රාජ්‍ය යාන්ත්‍රණයක් බිහි වීමෙන් පසු අදාළ යාන්ත්‍රණය වෙත මෙම මෙහෙයුම් කටයුතු පවරා දීමට නියමිතය. |
| | |